## ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2013

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 36 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාර නිකුත් කරනු ලැබේ. කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිත වලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලුම කරුණු සම්බන්ධයෙන් වන රීති සහ රෙගුලාසි ඇතුළත් පරිච්ඡේදයක් ද සහිතව කාර්යපරිපාටි සංග්‍රහයක් පිළියෙල කර මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර අනතුරුව ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවත් මේ සම්බන්ධයන් අංක පීඊඩී/12 සහ 2003 ජුනි 02 දිනැති යහපාලනය සඳහා මඟපෙන්වීමේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වැනි පරිච්ඡේදයේ 9.14 වගන්තියට අනුකූලව කටයුතු කිරීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) සේවක පිරිස් බඳවාගැනීම සහ ඔවුන්ගේ වැටුප් සහ අනෙකුත් පඩිනඩි නියම කිරීම සම්බන්ධයෙන් රජයේ චක්‍රලේඛවල දක්වා ඇති උපදෙස් හා නියෝගවලට මෙන්ම රාජ්‍ය ආයතන වලට අදාළ අනෙකුත් රීති සහ රෙගුලාසිවලට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. රජයේ රෙගුලාසිවලට අනුකූලවීමකින් තොරව සේවකයින් බඳවා ගැනීමට සහ ඔවුන්ගේ වැටුප් සහ පඩිනඩි නියම කිරීම පිණිස කොමිෂන් සභාවට අවසර තිබෙන බව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද 1992 මාර්තු 31 දිනැති ලිපියේ සඳහන් වේ. කෙසේ නමුත් රජයේ රීති සහ රෙගුලාසිවලින් බැහැරව කටයුතු කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අවශ්‍ය අනුමැතිය සභාව විසින් ලබාගෙන නොතිබුණි. තවද දැනට පවතින රජයේ නීති සහ රෙගුලාසිවලින් කොමිෂන් සභාව නිදහස් කිරීම පිළිබඳ කිසිදු විධිවිධානයක් 1989 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ ඇතුළත් නොවේ.

#### 2.2.2 අධිකාරී බලයකින් තොර ගනුදෙනු

ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගන්නා ලෙස රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව (රා.ව්‍යා.කා.ස) නියෝග කර තිබුණද , මෙකී අනුමැතිය ලබාගැනීමකින් තොරව කොමිෂන් සභාව විසින් රු.10,638,789 ක මුදලක් වාර්ෂික ප්‍රසාද දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු.305,703,501 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.206,497,805 ක් විය. මෙහෙයුම් වියදම් සඳහා රු.318,547,041 ක සෙස් අරමුදලින් මාරුකිරීම්

සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.12,843,540 ක අතිරික්තයක් විය. පෙර වර්ෂයේ ඌණතාවය එම වර්ෂයේ මෙහෙයුම් වියදම් සඳහා රු.218,522,637 ක සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව රු.12,024,832 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.818,708 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

ඉහත වර්ධනය සඳහා තුඩුදුන් ප්‍රධාන හේතු පහත පරිදි විස්තර කළ හැකිය.

මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරු කරන ලද රු. මිලියන 319 ද ඇතුළත්ව සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ ආදායම රු.මිලියන 348 ක් විය. ඉකුත් වර්ෂයේ අනුරූපී ආදායම මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකරන ලද රු. මිලියන 19 ද ඇතුළත්ව රු.මිලියන 225 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ආදායමෙහි සියයට 36.5 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. එසේම ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු සඳහා දරන ලද රු .මිලියන 24 ක වියදම හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඊට අනුරූපී වියදම රු. මිලියන 66 ක් වීමෙන් වියදමෙ සියයට 175 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ආදායම් හා වියදම්වල වෙනස්වීම් පහත දැක්වේ.

| | **2013** | **2012** | **වෙනස්වීම්** | **ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| සෙස් අරමුදලින් මාරු කිරීම | 319 | 219 | 100 | 46 |
| තැරැව්කාර බලපත්‍ර ගාස්තු, පරිපාලන බදු සහ අධ්‍යාපන වැඩසටහන් | 14 | 21 | (7) | (33) |
| විවිධ ආදායම් සහ ප්‍රදාන හඳුනාගැනීම් | 15 | 16 | 01 | 06 |
| සේවක මණ්ඩල සහ පරිපාලන පිරිවැය | 269 | 219 | 50 | 23 |
| ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වියදම් | 66 | 24 | 42 | 175 |
| වර්ෂයේ අතිරික්තය | 13 | 12 | 01 | 08 |

ඉකුත් වර්ෂයේ දී ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු සඳහා මුළු පිරිවැයෙන් දරන ලද සියයට 10 ක ප්‍රමාණය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා දරන ලද පිරිවැය සියයට 20 ක් වන බව නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීම**

සංයුක්ත සැලැස්මේ සහ සමාලෝචිත වර්ෂයේදී සංශෝධනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. විස්තර පහත සඳහන් වේ.

| අංශය | අරමුණු සහ ක්‍රමෝපායන් | ආරම්භකළ දිනය | නිම කිරීමට අපේක්ෂිත දිනය | 2013 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද වූ මාස ගණන | නිම කිරීම සඳහා සංශෝධිත දිනය |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය සහ පර්යේෂණ | නිෂ්පාදන පරාසය පුළුල් කිරීම සඳහා නව නිෂ්පාදන (ව්‍යුත්පන්න, පාරිභෝගික භාණ්ඩ) බිහිකිරීම. | | | | |
| | • පාරිභෝගික භාණ්ඩ සහ ව්‍යුත්පන්න භාණ්ඩ හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා පහසුකම් සැලසීම. | 2013 පළමු කාර්තුව | 2013 දෙවන කාර්තුව | 6 | 2013 සිව්වැනි කාර්තුව |
| | • මුදල් අමාත්‍යාංශය විසින් පත් කරන ලද .තා.ඇ.ක, කැ.ප.ප්‍ර.ක, සහ සු.හා වි.කො සභාවට උපදෙස් දීම සඳහා ආ.සා.බැ හෝ ලෝක බැංකුවෙන් නියෝජිතයෙකු පත් කිරීම. | | | | |
| | උපදේශක සඳහා නිර්නය විෂය | 2013 පළමු කාර්තුව | 2013 දෙවන කාර්තුව | 6 | 2013 සිව්වැනි කාර්තුව |
| | • උපදේශකවරයා පත් කිරීම. | 2013 පළමු කාර්තුව | 2013 දෙවන කාර්තුව | 6 | 2013 සිව්වැනි කාර්තුව |
| | • කොන්ත්‍රාත්තුව කෙටුම් පත් කිරීම. | 2013 පළමු කාර්තුව | 2013 දෙවන කාර්තුව | 6 | 2013 සිව්වැනි කාර්තුව |
| | • කොන්ත්‍රාත්තුව පිරිනැමීම | 2013 පළමු කාර්තුව | 2013 දෙවන කාර්තුව | 6 | 2013 සිව්වැනි කාර්තුව |
| මුල්‍ය සහ පරිපාලන | • තොරතුරු තාක්ෂණය අපද ප්‍රතිසාධන වෙබ් අඩවියක් ක්‍රියාත්මක කිරීම. | 2013 පළමු කාර්තුව | 2013 දෙවන කාර්තුව | 6 | 2013 සිව්වැනි කාර්තුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| විමර්ශන | • විමර්ශන යටිතල පහසුකම් සහ ක්‍රමවේද වැඩි දියුණු කිරීම. | 2009 පළවැනි කාර්තුව | 2009 තුන්වැනි කාර්තුව | 30 | 2013 සිව්වැනි කාර්තුව |
| | • තො.තා.නිමැයුම් උපයෝගී කරගෙන විමර්ශන හා සම්බන්ධ දත්ත සමුදාය වැඩි දියුණු කිරීම. | 2010 සිව්වැනි කාර්තුව | 2011 දෙවැනි කාර්තුව | 51 | 2014 පළවෙනි කාර්තුව |
| අධික්ෂණය | • ඒකක භාර කළමනාකරණ සමාගම් කිරීම සඳහා විද්‍යුත් ලිපිගොනු (E-filing) ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | 2009 පළවෙනි කාර්තුව | 2009 පළවෙනි කාර්තුව | 57 | 2013 සිව්වැනි කාර්තුව |
| | • වෙළඳපොල අතරමැදියන් සඳහා විද්‍යුත් ලිපිගෝණු (E-filing) ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | 2009 දෙවැනි කාර්තුව | 2009 සිව්වැනි කාර්තුව | 48 | |
| | ණය ප්‍රමාණන නියෝජිත ආයතන | | | | ඉවත් කළා |
| | ආයෝජන කළමනාකරුවන් | | | | 2014 සිව්වැනි කාර්තුව |
| | ආන්තික සැපයුම්කරුවන් | | | | 2014 දෙවැනි කාර්තුව |
| | ප්‍රාරක්ෂකයින් | | | | ඉවත් කළා |
| නෛතික සහ බලාත්මක කිරීම්. | නව පවරා ගැනීම් සහ ඒකාබද්ධ වීම පිළිබඳ නීති සංග්‍රහයේ කටයුතු අවසන් කිරීම. | 2010 පළවෙනි කාර්තුව | 2010 පළවෙනි කාර්තුව | 45 | 2013 සිව්වැනි කාර්තුව |

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාවේ පනත අනුව, මිලගණන් වංචා කිරීම, අභ්‍යන්තර / සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු , තැරැව්කරුවන්ගේ සදාචාර විරෝධී ක්‍රියාවන් යනාදී හඳුනාගත් නීති උල්ලංඝනය කිරීමේ අවස්ථා අවම කරගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව ක්‍රියාකළ යුතුය. එසේ වුවත් ආවේක්ෂණ අංශය සහ කොළඹ කොටස් වෙළඳපොල හරහා සමාලෝචිත වර්ෂයේ දි කොමිෂන් සභාව විසින් හඳුනාගෙන තිබූ සිද්ධීන් 31 න් සිද්ධීන් 2 ක් පමණක් විමර්ෂණය කිරීම සඳහා කොමිෂන් සභාව අවසර දී තිබුණි.

විමර්ශන අංශය විසින් විමර්ශන 15 ක් පවත්වා තිබූ අතර විමර්ශන 7 ක කටයුතු අවසන් කොට තිබුණි. ඉතිරි විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී. ඉහත කී විමර්ශන 15 න් විමර්ශන 9 ක් 2013 වර්ෂයට පෙර ආරම්භ කර තිබූ ඒවා වේ. කෙසේ නමුත් විශේෂයෙන්ම විමර්ශන ක්‍රියාවලියේ දී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවී ඇති බව නිරීක්ෂණය වේ. කොටස් වෙළඳපොලට අදාළ විමර්ශන අවසන් කිරීමට පෙර දීර්ඝ ක්‍රියාවලියක නිරතවීමට සිදුවීම මෙම ප්‍රමාදයට හේතු වූ බව කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් මාවෙත දැනුම් දෙන ලදී.

(ආ) මහාජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් දරන ලද රු. මිලියන 38.7 ක මුළු පිරිවැයෙන් රු. මිලියන 9.1 ක් හෙවත් සියයට 23 ක් "දැයට කිරුල "සහ " තාරුණ්‍යයට හෙටක් " යන වැඩසටහන් වෙනුවෙන් දරන ලද වියදම් වේ. ප්‍රාග්ධන වෙළඳපොල පිළිබඳ මහජනතාවට අවබෝධයක් ලබා දීම සඳහා ඉහත වැඩසටහන් වෙනුවෙන් කොමිෂන් සභාව විසින් වියදම් දරන ලද බව කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් මා වෙත දැනුම් දෙන ලදී.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 96 ක් වන නමුත් තත්‍ය සේවක සංඛ්‍යාව 83 කි. එම සේවක සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවා ශ්‍රේණි 8 ක් යටතේ වර්ගීකරණය කොට ඇති අතර 2014 ජූලි 30 දින වන විටත් පුරප්පාඩු පිරවීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ vii වන පරිච්ඡේදයේ 12:5:4 වගන්තිය අනුව භාණ්ඩාගාර ලේකම්ගේ හා රාජ්‍ය පරිපාලන ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව කොමිෂන් සභාව විසින් ස්ථිර නිලධාරයෙකුට වැඩබැලීමේ පත්වීමක් ලබා දී 2013 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා රු.311,250 ක වැඩබැලීමේ දීමනා ගෙවා තිබුණි. අංක 06 / 97 හා 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව වැඩබැලීමේ කාලපරිච්ඡේදය උපරිම මාස 03 ක් විය යුතු නමුත් වැඩබැලීමේ කාලපරිච්ඡේදය මාස 14 ක් වී තිබුණද වැඩබැලීමේ තනතුරේ පුරප්පාඩුව පුරවා නොතිබුණි.

**5. අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත සහ තත්‍ය වියදම් අතර සියයට 60 සිට සියයට 96 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය. එවැනි අවස්ථා කිහිපයක් පහතින් දැක්වේ.

(අ) කොමිෂන් සභාව විසින් ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 62.3 ක මුදලක් අයවැයගත කර තිබූ නමුත් රු. මිලියන 7.4 ක් පමණක් වැය කර තිබීම නිසා අයවැයගත වියදමේ විචලනය සියයට 88 ක් වී තිබුණි.

(ආ) නෛතික වියදම් වශයෙන් රු.මිලියන 11 ක් අයවැයගතකොට තිබූ අතර වැය කොට තිබුණේ රු. මිලියන 1.35 ක් පමණි. එම නිසා විචලනය සියයට 87 ක් වී තිබුණි.

(ඇ) සාමාජික ගාස්තු සඳහා රු. මිලියන 3.5 ක මුදලක් අයවැයගතකොට තිබූ නමුත් වැයකොට තිබුණේ රු. මිලියන 0.98 ක් පමණි. එම නිසා අයවැයගත වියදමේ විචලනය සියයට 72 ක් වී තිබුණි.

**6. පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අයවැය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) ආවේක්ෂණ සහ විමර්ශණ
(ඈ) අභ්‍යන්තර පාලනය